මාගේ අංකය - ආර්.ඩී.ඒ/එෆ්.ඩී /එෆ්.ඒ.එස්./11
මුදල් අංශය,
මාර්ග සංවර්ධන අධිකාරිය,
මඟ නැගුම මහ මැදුර,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11/07/2023

## මාර්ග සංවර්ධන අධිකාරිය
## භාවිතයෙන් ඉවත් කළ ටයර් සහ හිස් තාර බැරල් සඳහා මිළ ගණන් කැඳවීම

මාර්ග සංවර්ධන අධිකාරිය සතු භාවිතයෙන් ඉවත් කරන ලද ටයර් සහ හිස් තාර බැරල් පළාත්භාර අධ්‍යක්ෂ කොට්ඨාශ වල ගබඩා සහ වැඩ බිම් වල විකිණීමට තබා ඇති අතර, ඒවා ලබා ගැනීමට උනන්දුවක් දක්වන ගැණුම් කරුවන්ගෙන් මිළ ගණන් කැඳවනු ලැබේ.

මෙම අයිතම 2023/07/17 සිට 2023/08/07 දින පෙ. ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් පතෙහි දක්වා ඇති ස්ථානවලදී පරීක්ෂා කළ හැකි අතර මිළ ගණන් ඉදිරිපත් කිරීමේ ටෙන්ඩර් පත් මේ සමග අමුණා ඇත. ටෙන්ඩර් පත් නිකුත් කිරීමේ අවසාන දිනය හා වේලාව 2023/07/17 2023/08/08 දින දක්වා වන අතර (ටෙන්ඩර් පත් නිකුත්කිරීම ඉහත වැඩකරන සෑම දිනකම පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා වුවත් 2023/08/08 දින පමණක් පෙ.ව.9.00 සිටපෙ.ව. 10.30 දක්වා වේ.) ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය සහ වේලාව 2023/08/08 ප.ව. 1.00 දක්වා වේ.

### කොන්දේසි

1. ආපසු නොගෙවනු ලබන රුපියල් 2,000/- ක (එස්.එස්.සී.එල් සහ වැට් බදු සමග) මුදලක් ඉහත ලිපිනයේ මුදල් අයකැමිට ගෙවීමෙන් හෝ අදාල පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලයන්හි හෝ අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ අංශය - දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව - බෙලිඅත්ත යන කාර්යාලයන්හි ගණකාධිකාරීවරයාට ගෙවීමෙන් ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැක. මේ සඳහා ලිඛිත ඉල්ලීමක් කල යුතු අතර අයිතම වර්ග දෙකට වෙන වෙනම මෙන්ම ටෙන්ඩර් පත්‍රිකාවේ දක්වා ඇති ස්ථාන සඳහා ද වෙන වෙනම ටෙන්ඩර් පත්‍රිකා මිලදීගෙන ඉදිරිපත් කල යුතුය.

2. මිළ ගණන් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවර "භාවිතයෙන් ඉවත් කල ටයර් සඳහා මිළ ගණන් කැඳවීම හෝ හිස් තාර බැරල් සඳහා මිළ ගණන් කැඳවීම සහ ටෙන්ඩර් පෝරමයේ දක්වා ඇති පරිදි ඔබ ටෙන්ඩරය ඉදිරිපත් කරන ස්ථානයේ නම සඳහන් කල යුතුය.

3. ආපසු ගෙවනු ලබන තැන්පතු මුදලක් ලෙස රුපියල් 25,000/- ක් අයිතමයක් සඳහා, වෙන වෙනම (ටයර්/ බැරල් ) ගෙවීම් කිරීමෙන් පසු ලබාගන්නා කුවිතාන්සි අංක සහ දිනය අදාල ටෙන්ඩර් පත්‍රිකාවේ වෙන් කල කොටසේ සඳහන් කල යුතුවේ. එසේම බැංකු අණකරයක් (Bank Draft) මගින් ගෙවීම් කිරීමේදී අධ්‍යක්ෂ ජනරාල් මාර්ග සංවර්ධන අධිකාරිය නමින් එය ලබාගත යුතු අතර අවම දින 90 ක් වලංගු විය යුතු වේ.එසේ නොමැති ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ඇත.

4. මුද්‍රා තබන ටෙන්ඩර් අයදුම්පත්‍ර ඉහත සඳහන් ලිපිනයට 2023/08/08 දින ප.ව. 1.00 ට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නොමැති නම් ඉහත වේලාවට පෙර එම ලිපිනයේ පිහිටි ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම සිදුකළ යුතුය.

5. ආපසු ගෙවන ඇප තැන්පතු මුදල් නැවත ගෙවීම් කරනු ලබන්නේ අයිතමයන්හි ටෙන්ඩරය අවසාන වූවාට පසු වේ. ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටයර්/ බැරල් මිළදී ගැනීම සිදු නොකළ හොත් ඔහුගේ හෝ ඇයගේ ආපසු ගෙවන ටෙන්ඩර් මුදල නැවත ගෙවීම් කරනු නොලැබේ. මෙය අසාර්ථක ටෙන්ඩර්කරු සඳහා අදාල නොවේ.

6. ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කරන ටෙන්ඩර් පතෙහි ඔහුගේ නම ජාතික හැඳුනුම්පතෙහි පරිදි සඳහන් කළයුතු අතර ටෙනඩර් පතෙහි ඔහුගේ අත්සන යොදා (රබර් මුද්‍රාවක් ඇත්නම් එය යෙදිය යුතුය) ටෙන්ඩර් පත ඉදිරිපත් කල යුතුය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ටෙන්ඩර්කරු විසින් නම ජාතික හැඳුනුම්පතෙහි හෝ රියදුරු බලපත්‍රයේ පැහැදිළි පිටපතක් ඇමුණුම් කළයුතුය.)

7. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු වෙත දැනුම් දුන් දින සිට සති දෙකක් (වැඩ කරන දින 10 ක කාලයක් ) තුල සියළුම මුදල් ගෙවා එම ටයර්/ බැරල් ඉවත් කර ගත යුතුවේ.

8. සියළුම මිල ගණන් සඳහා පවතින ප්‍රතිශතය මත සමාජ ආරක්ෂණ බද්ද( 2.50 % ) හා අගය මත එකතු කල බද්ද (VAT 15%) අයකරනු ලැබේ.

9. ටෙන්ඩරය විවෘත කිරීම 2023/08/08 දින ප.ව. 1.00 ට සිදුකරන අතර එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහු වෙනුවෙන් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

10. ටෙන්ඩර් සඳහා අවසාන තීරණය අධිකාරයේ ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.

**අධ්‍යක්ෂ (මුදල්)**
**මාර්ග සංවර්ධන අධිකාරිය**